නානාට්ටාන් ප්‍රාදේශිය සභාව
මන්නාරම දිස්ත්‍රික්කය

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජනවාරි 24 වන දින ද සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට නානාට්ටාන් ප්‍රාදේශිය සභාවේ මූල්‍යය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දන්නා මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශ ලේකම්ගේ 2014 ජනවාරි 27 දිනැති හා පීඑල්/05/පීඒ/එස්එෆ්පීඑස්ඒඑස් අංක දරණ චක්‍ර ලේඛය පරිදි රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ප්‍රවර්තන වර්ෂයේ දී විගණන ගාස්තු සඳහා වෙන්කිරිම් රු. 40,000 ක මුදල ජංගම වගකීම් ලෙස පෙන්විය යුතු වුවත් එය කෙටිකාලීන ණය පොළී ගිණුම යටතේ වැරදි ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) ප්‍රවර්තන වර්ෂයේ දී මූල්‍ය ප්‍රකාශන තුල මූලධන වැය විෂයන් 03 ක් සඳහා වෙන්කල ප්‍රතිපාදන වූ රු. 529,050 ක මුදල වැරදි ලෙස පුනරාවර්තන වැය විෂයන් ලෙස වර්ග කර තිබුණි.

(ඉ) පළාත් පාලන අමාත්‍යාංශයෙන් 2011 වර්සයේ සිට 2015 වර්ෂය දක්වා ලැබිය යුතු මුද්දර ගාස්තු රු. 8,460,871 ක මුදල 2016 වර්ෂයේදී ලැබී තිබූ අතර එය මූල්‍ය ප්‍රකාශන තුල ආදායම් ලෙස හඳුනා නොගැනීමෙන් ප්‍රවර්තන වර්ෂයේ ආදායම රු. 8,460,871 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) ප්‍රවර්තන වර්ෂයේ දී උසාවි දඩ ගාස්තු ලෙස රු. 1,503,090 ක් ලෙස ගිණුම් වලට ඉදිරියට ගෙනවිත් තිබූ නමුත් උතුරු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය මඟින් උසාවි දඩ ගාස්තු ලෙස රු. 1,183,835 ක් ලෙස අනුමත කර තිබීමෙන් ප්‍රවර්තන වර්ෂයේ ආදායම රු. 319,255 කින් වැඩිපුර දක්වා තිබුණි.

1.3.3 නීති , රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති , රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම් විගනණයේදී නිරීක්ෂණය විය.

| නීති , රීති හා රෙගුලාසි සඳහා යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශිය සභා රීති සංග්‍රහය | |
| I. රීති අංක 5 (XII) | මූල්‍ය හා ගබඩා ගණුදෙණු පිළිබඳ වගකිව යුතු නිළධාරීන් වෙතින් ප්‍රමාණවත් ඇපකර ලබාගෙන නොතිබුණි. |
| II. රීති අංක 59 | සෑම වර්ෂයක්ම ආරම්භයේදී ආදායම් පරීක්ෂක හෝ ආදායම් පරිපාලක හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද නිළධාරියෙකු විසින් සභා බල ප්‍රදේශය තුල කර්මාන්ත පිළිබඳ පරීක්ෂණයක් පැවැත්විය යුතු වුවත් එසේ සිදුකර කර්මාන්ත පිළිබඳ බදු ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි. |
| III. රීති අංක 178 (3) | සභා බල ප්‍රදේශය තුල පිහිටි අනුමත ආයතන හාකොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ලේඛණයක් පිළියෙල කර නොතිබුණි. |
| IV. රීති අංක 218 | සභාවේ සභාපති , කාර්මික නිළධාරී සහ සභාවේ ලේකම්වරයා බලය පවරන ලද කවර හෝ නිළධාරියකු ලවා සෑම වර්ෂයකටම වරක් සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන සියළුම ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ පරීක්ෂාවක් සිදුකල යුතු වුවත් මෙම වාර්තාවේ දිනය දක්වා එසේ සිදුකර නොතිබුණි. |
| (ආ) 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා ආඥා පනත | |
| 150(1) වගන්තිය | ව්‍යාපාර පිළිබඳ රෙජිස්ටරයක් සකස් කර වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| I. මුදල් රෙගුලාසි 371 | 2001 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා විවිධ කාර්යයන් සඳහා සභා නිළධාරීන් සහ බාහිර පුද්ගලයින් හට ලබා දුන් රු. 1,828,506 ක් වටිනා අත්තිකාරම් මුදල් මේ දක්වා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි |

| | |
|---|---|
| II. මුදල් රෙගුලාසි 571 | 2011, 2012 වර්ෂ වල සේවකයින්ගේ වැටුපෙන් අවස්ථා 12 කදී අඩුකර තිබූ සේවක අර්ථසාධකඅරමුදල් හා සේවක භාරකාර අරමුදල් රු. 123,385 ක මුදල එම ආයතන වලට ප්‍රේෂණය නොකර පොදු තැන්පතු වල විගණන දිනය දක්වා රඳවා ගෙන තිබුණි.<br><br>විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.50,358 ක මුදල ප්‍රේෂණය නොකර පොදු තැන්පතු වල විගණන දිනය දක්වා රඳවා ගෙන තිබුණි. |

1.3.4 අධිකාරී බලය නොලත් ගණුදෙණු
----------------------------------------
පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) ප්‍රවර්ථන වර්ෂයට අදාල අයවැය ලේඛණයෙහි ප්‍රතිපාදන නොකරන ලද වැය විෂයන් 13 ක් වෙනුවෙන්රු. 21,005, 241 ක මුදලක් වියදම් කර තිබුණි.

(ආ) ප්‍රවර්ථන වර්ෂයට අදාල අයවැය ලේඛණයෙහි ප්‍රතිපාදන නොකරන ලද මූලධන වැය විෂයන් 05 ක් වෙනුවෙන් රු. 17, 282, 285 ක මුදලක් වියදම් කර තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
-----------------

ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සදහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 7,335,045 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ වියදම රු. 1,725,031 ක් විය. මේ අනුව රු. 9,060,076 කින් මූල්‍ය ප්‍රතිඵලය වර්ධනව වී තිබූ අතර රාජ්‍ය ප්‍රදාන ලැබීම් හා ආදායම් වැඩිවීම එයට හේතු වී තිබුණි.

2.2 ආදායම් කළමණාකරණය
-------------------------------

2.2.1 ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය
-------------------------------
සභාව විසින් ප්‍රවර්ථන වර්ෂය වෙනුවෙන් අයවැය ගත කළ ආදායම හා සත්‍ය ආදායම අතර රු. 11,005,245 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.2.2 බදු කුලී
---------
සභා බල ප්‍රදේශයට අයත් කඩ වලින් අයවිය යුතු බදු කුලී රු. 1, 549, 147 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 අනෙකුත් ආදායම්

----------------------

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) සභා බල ප්‍රදේශය තුල පෞද්ගලික සමගම් විසින් දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 06 ක් ස්ථාපිත කර තිබූ අතර ඉන් දුරකථන කුළුණු 02 කට අයත් පෞද්ගලික සමාගම් වලින් දුරකථන සම්ප්‍රේෂණ කුළුණු ඉදිකිරීමේ ගාස්තු වන රු. 50,000 ක් සභාව විසින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශය තුල ස්ථාපිත කරන ලද දුරකථන සම්ප්‍රේෂණ කුළුණු වලින් එය ස්ථාපනය කළ දින සිට 2016 මැයි 28 දින දක්වා මාසික ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කළමනාකරණ දුර්වලතා

----------------------------

පරිගණක යන්ත්‍ර 03 ක් හා පොටෝ කොපි යන්ත්‍රයක් භාවිතයට නොගෙන නිශ්කාර්යව තබාගෙන තිබුණි.

3.2 අනාර්ථික ගණුදෙණු

------------------------

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) නානාට්ටාන් ප්‍රාදේශිය සභාවට අයත් මුරුංකන් උප කාර්යාලය සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයෙන්අන්තර්ජාල පහසුකම් 2014 අප්‍රේල් සිට ලබාගෙන තිබූ නමුත් 2016 මැයි මස දක්වා වයිෆයි රවුටර් සවි නොකිරීමෙන් එම කාලය තුල ගෙවූ රු. 35, 253 ක් වටිනා අන්තර්ජාල ගාස්තු නිශ්කාර්ය වියදමක් වී තිබුණි.

(ආ) පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව රු.මිලියන 2.9 ක් වටිනා ලංකා බැංකුවෙහි පවත්වාගෙන ගිය ස්ථාවර තැන්පතුවක් 2011 ජූනි 29 දින මුදල් කරගෙන තිබුණි.

3.3 ව්‍යාපෘති නිම නොකිරීම්

---------------------------

ප්‍රවර්තන වර්ෂයට අදාල අයවැය ලේඛණය මඟින් ප්‍රතිපාදන වෙන්කර ගත් ව්‍යාපෘති 38 ක් හා රු. 7,194,382 කට අදාලව ප්‍රතිපාදන සියයට 40 සිට සියයට 100 දක්වා භාවිතා නොකර ඉතිරි කර තිබුණි.

3.4 කාර්යසාධන වාර්තාව

-------------------------

මහා භාණ්ඩාගාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ 2010 මාර්තු 10 දිනැති හා අංක PF/R/2/2/3/5/(4) දරන ලිපියෙහි 1.4.1 වගන්තිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාවක් සකස් කළ යුතු වුවත් සභාව විසින් ප්‍රවර්ථන වර්ෂය සඳහා කාර්යසාධන වාර්තාවක් 2016 අගෝස්තු 10 දින දක්වා පිළියෙල කර නොතිබුණි.

4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය
-----------------------------------------

අයවැය පාලනය
-------------------

ප්‍රවර්ථන වර්ෂයේ අයවැය ලේඛණය මහින් ප්‍රතිපාදන කරන ලද ව්‍යාපෘති 24 කට අදාල රු. 9,664,397 ක් වටිනා මුළු ප්‍රතිපාදනයම භාවිතා නොකර ඉතිරි කර තිබුණි.

5. පද්ධති හා පාලන
--------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ආදායම් රැස්කිරීම්
(ආ) අයවැය පාලනය
(ඇ) ලැබිය යුතු ගිණුම්
(ඈ) ස්ථාවර තැන්පතු
(ඉ) ගිණුම්කරණය